# මැටි කරත්තය නාට්‍යයෙන් නිරූපිත සමාජ පුරුෂාර්ථයන්හි සර්වකාලීන වටිනාකම පිළිබඳ අධ්‍යයනයක්

එස්. ජී. ගයානි මධූෂා කුමාරි[1]

සංස්කෘත දෘශ්‍ය කාව්‍ය නාමාවලියේ ප්‍රකරණ ගණයට අයත් වන මෘච්ඡකටිකා නම් නාට්‍යය ශුද්‍රකගේ නිර්මාණයකි. මැටි කරත්තය එකී දෘශ්‍ය කාව්‍යයේ සිංහල පරිවර්තනය යි. බොහෝ සංස්කෘත නාට්‍යයන්හි වස්තු විකාශය රාජකීය කාමභෝගී ජීවිතය වටා ගෙතී පවතින අතර රාජකීයයන්ගේ ත්‍රිකෝණාකාර ප්‍රේම අරගල, යුද ගැටුම් ඒවායින් නිරූපිත සුලබ සිදුවීම් විය. එහෙත් ශුද්‍රකගේ ප්‍රතිභා මහත්වයෙන් සංස්කෘත දෘශ්‍ය කාව්‍යාවලියට ඇතුළත් වන මැටි කරත්තය සංකීර්ණ සමාජ සංස්ථාවක තතු විදාරණය කරයි. මේ නාට්‍යයේ විශේෂත්වය වනුයේ රාජකීයයාගේ සිට අන්ත දුගී දුප්පතා දක්වා සමාජ ස්තර නියෝජනය කරන පාත්‍ර වර්ගයා ප්‍රේක්ෂකයා අබිමුවට කැඳවීමත් එසේ ම එකී චරිත ක්‍රියාකාරිත්වයෙන් නාට්‍යකරුවා සමාජගත කරවීමට උත්සාහ දරන සමාජ පුරුෂාර්ථ අද්‍යතන සමාජ දේහයට වුව ගළපාගැනීමේ යෝග්‍යතාවක් පැවතීමත් ය. සමාජ පුරුෂාර්ථ යනු මිනිස් ජීවිතය විශිෂ්ටත්වයට පත් කරන අගය වේ. විෂම සමාජ තත්ත්වයන්හි පසු වන නානාවිධ චරිතයන්ගේ සංකීර්ණ ජීවන රටාවන් විවරණය කරන පෘථුල සමාජ විවරණයක් මේ නාට්‍යයෙන් ප්‍රතිබිම්බිත වනවා සේ ම එකී චරිත ක්‍රියාකාරිත්වයෙන් ප්‍රේක්ෂකයා වෙත සම්ප්‍රේෂණය කරන පුරුෂාර්ථයන්හි සර්වකාලීන අගයක් ද පවතින බව මෙකී නාට්‍යය පරිශීලනය කිරීමේ දී පැහැදිලි වන කරුණකි. දේශපාලන බලය අතට ගෙන නොයෙකුත් දුරාචාරවලට යොමු වන පාත්‍රයන් මඟින් විවරණය වනුයේ බලකාමී දේශපාලන සංස්කෘතියේ සාර්වත්‍රික සත්‍යයකි. ජනතාව ආර්ථික ශක්තියෙන් හීන ව යන කල සමාජ විරෝධී ජීවිකා වෘත්තීන් වෙත යොමු වීම ස්වාභාවික ය. එහෙත් එවැනි තත්ත්වයන් හමුවේ වුව ද සිය ගුණ දහම් පසෙක ලා උදර පෝෂණය කෙරෙහි නැඹුරු නො වන සමාජ පුරුෂාර්ථ අගය කරන්නන් ද ඉඳහිට හෝ සමාජ කරළියේ දෘශ්‍යමාන වීම ද සමාජ සත්‍යයකි. සූදුව වැනි දුශ්චරිත ක්‍රියාකාරකම්වල යෙදෙන්නන් ඕනෑ ම සමාජ ව්‍යුහයක දැකිය හැකි ය. සමාජයේ යහපැවැත්මට සංරෝධක සේ ක්‍රියා කරන එවැනි පුද්ගලයන් යහමඟට ගැනීමේ ශක්‍යතාව ද සමාජය සතු බව නාට්‍යයෙන් හැඟවේ. ඒ අනුව මැටි කරත්තය නාට්‍යයෙන් නිරූපිත සමාජ පුරුෂාර්ථයන්හි සර්ව කාලීන වටිනාකමක් පවතින බව තහවුරු වේ.

**ප්‍රමුඛ පද:** මෘච්ඡකටිකා, මැටි කරත්තය, ශුද්‍රක, ප්‍රකරණ, සමාජ පුරුෂාර්ථ

[1] සිංහල අධ්‍යයනාංශය